






### මනාප නැති මැතිවරණ ක්‍රමය හැදෙන්නේ මෙහෙමයි

# 20 වන සංශෝධනයෙන් යෝජිත මැතිවරණ ක්‍රමය කුමක්ද?

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 20 වන සංශෝධනය ලෙස යෝජනා වී කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් වූ යෝජිත මැතිවරණ ක්‍රමය සැකවින් මෙසේය.**

01. නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කරනු වස් ජනතාවට වැඩි නියෝජනයක් ලබාදීම සඳහා පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් සංඛ්‍යාව 255 ක් බවට පත් කිරීම.

02. මාස තුනක් තුල කටයුතු අවසන් කරන සීමා නිර්ණය කිරීමේ කොමිෂන් සභාවක් පත් කිරීම සහ ඊට නීතිමය බලතල ලබාදීම. එම කොමිසම විසින් දිවයිනේ මැතිවරණ කොට්ඨාස (දිස්ත්‍රික්ක) 20 - 25 අතර සංඛ්‍යාවකට බෙදා වෙන්කිරීම. එක් එක් මැතිවරණ කොට්ඨාස ඡන්ද ප්‍රදේශ (ආසන) 3 - 16 දක්වා අවමයකට සහ උපරිමයකට පත් කිරීම.

03. ඡන්ද ප්‍රදේශ වෙන් කිරීම සඳහා භූගෝලීය ලක්ෂණ, ජනවාර්ගික අනුපාතය, සංවර්ධන මට්ටම, සංස්කෘතික ලක්ෂණ හා ඡන්දදායක සංඛ්‍යාව නිර්ණය ලෙස භාවිත කරන විද්‍යාත්මක ක්‍රමවේදයක්.

04. කේවල මන්ත්‍රී කොට්ඨාස වලට අමතරව සුළු ජාතික නියෝජනය තහවුරු කෙරෙන බහු මන්ත්‍රී කොට්ඨාස ඇති කෙරේ. කේවල සහ බහු මන්ත්‍රී කොට්ඨාසවලින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 165ක් තෝරා ගනු ඇත.

05. දැනට පවත්නා දිස්ත්‍රික් මන්ත්‍රී ධුර 196 සමානුපාතික ක්‍රමය යටතේ පක්ෂ හා කණ්ඩායම් දිස්ත්‍රික්කයකදී ලබාගන්නා ඡන්ද ප්‍රතිශත අනුව බෙදාදීම තවදුරටත් ක්‍රියාත්මක වෙයි.ඒ අනුව අද පවත්නා ක්‍රමයට අනුව දිස්ත්‍රික්ක සමානුපාතික නියෝජනයකට දිස්ත්‍රික්කයේ මන්ත්‍රී ධුර සංඛ්‍යාව පක්ෂ අතර බෙදී යයි.දිස්ත්‍රික්ක වල වැඩිම ඡන්ද ලබාගන්නා පක්ෂයට හෝ කණ්ඩායමට අයත් ප්‍රසාද (බෝනස්) මන්ත්‍රීධුරයද තව දුරටත් පෙර ආකාරයෙන්ම පවතී

06. නාම යෝජනා භාර දීමේ දී දිස්ත්‍රික් මට්ටම සඳහා සමානුපාතික ක්‍රමය යටතේ පත්විය හැකි උපරිම මන්ත්‍රීවරුන් සංඛ්‍යාවට 3ක් එකතු කිරීමෙන් ලැබෙන සංඛ්‍යාවට සමාන අපෙක්ෂකයින් සංඛ්‍යාවක් මැතිවරණ කොට්ඨාස සඳහා නාම යොජනා කළ යුතු අතර ඡන්ද ප්‍රදේශවලට තරග කරන අපේක්ෂකයින් නිශ්චිතව සඳහන් කළ යුතුය. ඡන්ද කොට්ඨාශවලට ඉදිරිපත්වන අපේක්ෂකයින්ට තම කොට්ඨාසය තුළද, අමතරව ඉදිරිපත්වන අපේක්ෂකයින්ට පක්ෂය වෙනුවෙන් දිස්ත්‍රික්කය පුරා ඡන්ද ප්‍රචාරක කටයුතු සිදු කළ හැකිය.

07. පැරණි මනාප ඡන්ද ක්‍රමය අහෝසි වන අතර කොට්ඨාස ජයග්‍රහණය කරන අපේක්ෂකයින්ට සමානුපාතික ක්‍රමය තුළ පක්ෂයට ලැබෙන පාර්ලිමේන්තු ආසන නියෝජනය කිරීමේ අවස්ථාව ලැබේ.

08. යම් පක්ෂයක් හෝ කණ්ඩායමක් සමානුපාතික ක්‍රමයට හිමිවන මන්ත්‍රීධුර වලට වඩා අඩු ප්‍රමාණයක් ජය ලබා ඇති විට ඒ ඒ ඡන්ද ප්‍රදේශ සඳහා එක් එක් පක්ෂයේ හෝ කණ්ඩායමේ තරග කළ තේරී පත් නොවූ අපේක්ෂකයින් ස්වකීය ඡන්ද කොට්ටාසවලදී ලබාගත් ඡන්ද ප්‍රතිශතය අනුව ඉහළ සිට පහළට තෝරා ගත යුතුය. නැතහොත් පක්ෂය විසින් නම් කළ යුතුය.

09. 29 සිට 59 දක්වා ඉහළ නංවා ඇති ජාතික ලැයිස්තුවෙන් පක්ෂයක් හෝ කණ්ඩායමක් ලබාගන්නා පාර්ලිමේන්තු ආසන සමානුපාතික ක්‍රමය තුළ පාර්ලිමේන්තු ආසන නොලබන කොට්ඨාස ජයග්‍රහණය කළ මන්ත්‍රවරුන්ට පළමුව ලබාදෙයි. ඉතිරි ජාතික ලැයිස්තු මන්ත්‍රී ධුර පෙර පරිදිම තෝරා ගැනේ.

10. ඡන්ද ප්‍රදේශය නියෝජනය කරන මන්ත්‍රී ධුරයක පුරප්පාඩුවක් ඇතිවූ විට අතුරු මැතිවරණයක් පැවැත්විය යුතුය.

11. ජාතික ලැයිස්තු මන්ත්‍රී ධූරයක් සඳහා අවශ්‍ය අවම ඡන්ද සංඛ්‍යාව වත්මන් අගයට වඩා පහල අගයක් ගැනීම නිසා රට පුරා විසිරුණු හෝ සුළු පක්ෂවලට ජාතික ලැයිස්තුවෙන් නියෝජනය තහවුරුවීම. (වත්මන් ක්‍රමය යටතේ ප්‍රකාශිත ඡන්ද සංඛ්‍යාව 29 බෙදා එක් මන්ත්‍රී ධූරයක් සඳහා අවශ්‍ය ඡන්ද සංඛ්‍යාව ගණනය වන අතර යෝජිත නව ක්‍රමය යටතේ එය 59 න් කොටසකට මන්ත්‍රී ධූරයක් හිමිවේ.)